# හෙගලියානු දයලෙක්තිකය

ආචාර්ය සමන් පුෂ්පකුමාර

## 1. හැඳින්වීම

මෙම ලිපියෙන් බලාපොරොත්තු වන්නේ ග්‍රීක හා ජර්මානු චින්තනය හරහා විල්හෙල්ම් හෙගල්ගේ දයලෙක්තික චින්තනය වර්ධනය වූ ආකාරය විමසීමකි. හෙගල්ගේ ප්‍රධාන කෘති තුළ දයලෙක්තිකය සම්බන්ධයෙන් දක්වා තිබෙන අදහස් ප්‍රමාණයක් මෙහිදී විමසා බැලෙයි.

## 2. ග්‍රීක දර්ශනය තුළ දයලෙක්තිකය

දයලෙක්තිකය (Dialectics) යන්නෙහි නිරුක්තිය සොයා ගෙන ගියොත් අපට ලැබෙන්නේ dialetikē යන ග්‍රීක වචනය යි. එහි තේරුම වන්නේ 'සංවාද කලාව' (art of conversation or discussion) යන්න ය. වෙනත් ලෙසකින් කීවොත් දෙකට බෙදා ගෙන කරන තර්ක කිරීම හෝ හේතු දැක්වීම ය (reasoning by splitting into two). පැරණි ග්‍රීකයෝ ප්‍රශ්න කිරීම හා පිළිතුරුදීම හරහා සංවාදයක් වර්ධනය කර යම්කිසි තුලිත ලක්ෂයකට පැමිණීම දයලෙක්තිකය වශයෙන් ගත්හ. දයලෙක්තිකය සොයා ගැනීම සම්බන්ධයෙන් ඇරිස්ටෝටල් ගෞරවය දෙන්නේ සීනෝට ය. සීනෝගේ සුප්‍රකට විරුද්ධාභාස (paradox) වලට ය. සීනෝ 'චලනය' පිළිගත් සිය ප්‍රතිවාදී දර්ශනිකයන්ගේ මතයන් ඛණ්ඩනය කිරීමේදී සිය ප්‍රතිවාදීන්ගේ උපන්‍යාසයන්හි ඇති විසංවාදය පෙන්වීම සඳහා විරුද්ධාභාසයන් යොදා ගෙන ඇත. සීනෝගේ තර්කයන් අතර එකක් වූයේ වේගයෙන් විදින ලද ඊතලයක් චලනය නොවන බව ය. විදින ලද ඊතලය ඕනෑම මොහොතක නිශ්චිත අවකාශයක පිහිටීමක් අත්පත් කර ගන්නා නිසා ඊතලය චලනය නොවන බව ඔහු පැවසීය. ග්‍රීක දයලෙක්තිකයට වෙනත් ආරම්භයක් සොක්‍රටීස් විසින් ලබා දුන්නේ ය. ඇරිස්ටෝටල් ගේ Topics වලින් අණාවරණය වෙන

ආකාරයට ඇරිස්ටෝටල්ට සෑහෙන කාලයකට ප්‍රථමව සොක්‍රටීස් විසින් දයලෙක්තිකය භාවිතා කොට ඇත. යම් පුද්ගලයින් දෙදෙනෙකු සංවදායකට එළඹුනා යැයි සිතමු. එක් කෙනෙකු ප්‍රශ්න කරන්නාය. අනෙකා පිළිතුරු දෙන්නාය. ප්‍රශ්න අසන්නාගේ සාමාන්‍යය පිළිවෙත ප්‍රශ්න ඇසීම පමණි. පිළිතුරු දෙන්නා පටන් ගන්නේ යම් ආකාරයක ප්‍රවාදයක් (Thesis) ඉදිරිපත් කිරීමෙන් ය. 'දැනුම වනාහි ඉන්ද්‍රීය සංවේදනය වේ' වැනි ප්‍රවාදයක් මෙහිදී ඉදිරිපත් විය හැකි ය. ප්‍රශ්න නඟන්නා කරන්නේ විවිධාකාර අතුරු ප්‍රශ්න නඟමින් මූලික ප්‍රවාදය සමඟ විසංවාද වන කරුණු මතු කර ගැනීම ය. සොක්‍රටීස්ගේ විධික්‍රමය මෙය වෙයි. සොක්‍රටීස් පටන් ගන්නේ "මම නම් මේවා ගැන දන්නේ නැහැ. ඔබලානේ මේ ගැන දන්නේ" යැයි තමන්ගේ නොදන්නාකම මුලින්ම ප්‍රකාශ කිරීමෙනි. මේ අතරේදී ප්‍රතිවාදියා විසින් ඉදිරිපත් කළ ප්‍රවාදයේ විවිධාකාර විසංවදායන් පෙන්වාදී ප්‍රතිවාදියාගේ අඥානකම තමන්ට ම දැන ගැනීමට ඉඩ හරියි. මේ ක්‍රමයට 'reductio ad absurdum' හෙවත් 'ප්‍රසංග සාධනය' යැයි කියනු ලැබේ. මෙහිදී සොක්‍රටීස් විසින් ප්‍රතිවාදියාගේ තර්කයේ තිබෙන විසංවාදය පෙන්වාදී තමන්ගේ (සොක්‍රටීස්ගේ) අදහසෙහි නිවරුදි බව ඔප්පු කරනු ලැබේ. සොක්‍රටීස්ගේ මේ දයලෙක්තික ක්‍රමයේ අරමුණ වූයේ සත්‍යය හෙවත් ප්‍රඥාව (wisdom) අවබෝධ කර ගැනීම ය. සදාකාලික, සාර්වත්‍රික, ආවශ්‍යයක, නිශ්චිත දැනුමක් උදාකර ගැනීම ඔහුගේ අරමුණ විය. ප්ලේටෝ සිය Republic වල දයලෙක්තිකය සැලකුවේ දාර්ශනික රජෙකු බිහි කර ගැනීමේ අධ්‍යාපන ක්‍රමවේදයේ ආවශ්‍යක කොටසක් ලෙසට ය. ඇරිස්ටෝටල් දයලෙක්තිකය ගත්තේ සාකච්ඡාව හරහා අදහස් ලබා ගැනීමේ (endoxa) ක්‍රමවේදයක් ලෙසට ය. ඇරිස්ටෝටල්ගේ සංකල්පකරණයට අනුව 'endoxa' යනු යම් තර්කයකට පක්ෂව හා විපක්ෂව ඇති කරුණු සළකා බැලීමෙන් අනතුරුව සියළු දෙනාට පිළිගත හැකි අදහසකට පැමිණීම ය.

### 3. ජර්මන් විඥානවාදය තුළ දයලෙක්තිකය

කාන්ට් සිය Critique of Pure Reason කෘතියේ අනුභූති-උත්තර දයලෙක්තිකය (Transcendental Dialectic) වශයෙන්දීර්ඝ ක්ෂේත්‍රයක් ගැන කරුණු දක්වා ඇත. කාන්ට්ට අනුව දයලෙක්තිකය

අනුභූති-උත්තර තර්කනයේ (Transcendental Logic) කොටසකි. එය මඟින් පෙන්නුම් කරන්නේ අනුභූතික දත්ත නොමැති ක්ෂේත්‍රයන්ට හේතුව (Reason) යෙදීම නිසා ඇතිවන අන්‍යෝන්‍ය වශයෙන් විසංවාදී (mutualily contradictory) යුගලයන් හෝ න්‍යාය විරෝධී තත්ත්වයන් ඇතිවන ආකාරය ය. මෙහිදී සිදුවන්නේ මිනිස් විචාරය අවබෝධයේ මට්ටමින් ඔබ්බට ගොස් ඉහළ සංවාදයක් ඇති කර ගැනීමට උත්සාහ ගැනීමය. අනුභූතියෙන් දෙන ලද දත්තයන්ගෙන් ඔබ්බට ගොස් එවැනි දැනුමක් ලබා ගැනීමට උත්සාහය ගත්තත් දැනුමක් ලැබෙන්නේ නැත. අනුභූතිය නොමැතිව ශුද්ධ විචාරය හරහා ආත්මය, විශ්වය සහ දෙවියන් ගැන දැනුමක් ලබා ගැනීමට උත්සාහ ගැනීමේදී එක්කෝ නැතිනම් චින්තනයක් (either or thinking) මතු වේ. අන්‍යෝන්‍ය වශයෙන් විසංවාදී යුගල බිහිවේ. මේ යුගලයන්හි පාර්ශව දෙකම (thesis and anti-thesis) සාධනය වේ. කාන්ට්ගේ Prolegomena to Any Future Metaphysics කෘතියේ මෙන් ම Critique of Pure Reason වල මෙම යුගලයන් මෙසේ දක්වා ඇත.

1. වාදය-ලෝකයට කාලය තුළ පටන් ගැනීමක් ඇත. එය අවකාශය අතින් සීමිත ය.

ප්‍රතිවාදය-ලෝකයට පටන් ගැනීමක් නොමැත. එය අවකාශය තුළ සීමාවක් ද නැත; ලෝකය කාලය සහ අවකාශය යන දෙක අතින් අනන්ත ය.

2. වාදය-ලෝකයේ ඇති සෑම සංයුක්ත වසතුවක්ම සරල කොටස් වලින් සෑදී ඇත.

ප්‍රතිවාදය-ලෝකයේ කිසිම සංයුක්ත දෙයක් සරල කොටස් වලින් සෑදී නොමැත; ලෝකයේ කිසිම තැනක සරළ වූ කිසිවක් නැත.

3. වාදය-ස්වතන්ත්‍ර ලෙස (freedom) ලෝකයේ සිදුවන දේවල් ඇත.

ප්‍රතිවාදය-ස්වතන්ත්‍ර ලෙස සිදුවන කිසිවක් නැත; සියළුම දේවල් සොබාදහමේ නීතීන් අනුව ක්‍රියාත්මක වෙයි.

4. වාදය-ලෝකයේ හේතුව වශයෙන් ආවශ්‍යක සත්ත්වයෙක් ඇත.

ප්‍රතිවාදය-ආවශ්‍යක සත්ත්වයෙක් ලෝකයේ නැත.

කාන්ට් මෙසේ හිර වූ න්‍යාය විරෝධයන්ගෙන් (antinomies) ගැලවීමට (එක්කෝ නැත්නම් චින්තනයෙන් ගැලවීමට) හෙගල් මාර්ගයක් විවෘත කර දෙයි. හේගලගේ සමපේක්ෂණ තර්කනය (Speculative Reason) ඉදිරිපත් කරන්නේ මේ සඳහා ය. හේගලියානු දයලෙක්තිකය තුළ මෙම විසඳුම ඉදිරිපත් වේ.

**4. හේගලියානු දයලෙක්තිකය**

හේගල් සිය චින්තනය ඉදිරිපත් කරන්නේ 'දයලෙක්තික' නාමය යටතේ ය. නමුත් හේගල් 'දයලෙක්තික' යන නාමය යෙදුවේ ඉතාමත් කලාතුරකිනි. නව සංකල්ප අපෝහනය වන්නේ පැරණි සංකල්ප වලින් බවත් පැරණි සංකල්පවල සීමාවන්, විසංවාදයන් හා ඌනතාවන් අනාවරණය කරමින් හා අළුත් සංකල්ප වලට නව ආලෝකය ලබා දෙමින් චින්තනය අපෝහක වර්ධනයක යෙදෙන බවත් මෙයින් කියවිණි. මෙය තව දුරටත් ගණිතමය ප්‍රමේයන් සාධනය කිරීමේ ක්‍රියාවලියක්, ඇරිස්ටෝටලියානු සංවාක්‍ය තර්ක ක්‍රමයක් හෝ නූතන තර්ක ශාස්ත්‍රයේ ව්‍යුත්පන්න ක්‍රියාවලියක් නොවේ. හේගල් සිය The Encyclopaedia of the Philosophical Sciences in Basic Outline: Part I:Science of Logic කෘතීන් තුළ දයලෙක්තිකය යන්නට නිර්වචනයක් සපයයි. හෙගලියානු දයලෙන්තිකය සම්බන්ධයෙන් වඩාත් ප්‍රයෝජනවත් විස්තරය මෙය නිසා එය ඉංග්‍රීසි භාෂාවෙන් ම මුලින් උපුටා දක්වමි.

§ 79

In terns of form, the logical domain has three sides: (α) the abstract side or that of the understanding, (β) the dialectical or negatively rational side (μ) the speculative or positively rational side.

These three sides do not constitute three parts of logic, had are moments of every properly logical content [Moments jades logisch – Reellen], that is to say, of every concepts or everything true in general.

§ 80

(α)Thinking as understanding does not budge beyond the firm determinateness [of what is entertained] and distinctness over against others. A limited abstraction of this sort counts for it as self-standing and [as having] being [as für sich bestehend and seined]

§ 81

(β)The dialectical movment is the self-sublation of such finite determination by themselves and their transition into their opposite

§ 82

(μ) The speculative or positively rational grasps the unity of the determinations in their oppositions, the affirmative that is contained in their dissolution and their passing over into something else. (Hegel 1975, 125-132)

මෙම නිර්වචනය විශ්ලේෂණය කළොත් දයලෙක්තිකය සම්බන්ධයෙන් පහත ආකාරයේ පැහැදිලි කිරීමක් කළ හැකිය. දයලෙක්තිකය වර්ධනය වන්නේ අවධි තුනක් හරහා ය. ඒවා නම්:

1. වියුක්ත අවධිය (the Abstract stage, or that of the understanding)

2. දයලෙක්තික නිශේධනමය අවධිය (the dialectical, or that of negative reason)

3. සමපේක්ෂණ අවධිය (the speculative, or that of positive rason)

හේගල් සිය නිර්වචනයෙන් ඉදිරිපත් කරන්නේ චින්තනය හෝ සංකල්පය අවධි තුනක් ඔස්සේ වර්ධනය වෙන ආකාරය ය. චින්තනය වර්ධනය වන්නේ අවධි තුනක් හරහා වුවත් ඒ අවධීන් එකිනෙකින් ස්වායත්ත අවධි නොව එකම ක්‍රියාවලියක අවධි තුනක් බව ය. පළමු අවධියේදී සිදුවන්නේ අවබෝධන ක්‍රියාවලියකි (understanding). වියුක්ත අවධියේදී සංකල්පයන් ඝණීභූත ඒවා ලෙස වියුක්ත ඇත. අප යමක් වියුක්තව දකින අවධිය මෙය වේ. මෙහිදී සාරාර්ථයන් හා සත්තාවන් එහිම වූ ඒවා ලෙස පිහිටයි. දේවල් ස්වයං-සාම්‍යය (self-identical) ලෙස මෙහිදී දකී. ලෝකය මේ ආකාරයට දැකීමේ වරද වන්නේ වියුක්තකරණයන් මඟින් වඩාත් සංකීර්ණ අන්තර් සබඳතාවයන් තේරුම් ගත නොහැකි නිසා ය. මේ නොහැකියාව නිසා චින්තනය ඊළඟ අවධියට තල්ලු කෙරේ. මේ අවධිය දයලෙක්තික අවධිය ය.

දයලෙක්තික අවධියේදී පරිමිත ප්‍රවර්ගයන් හෝ සූත්‍රයන් ඒ තුළම දිය වී ගොස් එහි ප්‍රතිවිරුද්ධ ප්‍රවර්ගයන් බවට පත්වේ. මෙහිදී සිදුවන ක්‍රියාව නිශේධනමය එකකි. මේ අවධියේදී දේවල් අධ්‍යයනය කරන්නේ ඒවායේ සත්තාව වන චලිතය ඔස්සේ ය. වියුක්ත අවධියේදී බල කෙරෙන්නේ සංකල්පීය බෙදීම් හරහා ලෝකය තේරුම් ගැනීමටය. එයින් යමෙක් ව යොමු කරවන්නේ අනවබෝධයකට ය. ඒකපාර්ශවීය දැක්මකට ය. එයින් දේවල් වල ඇත්ත තත්ත්වය පරිපූර්ණ ලෙස ප්‍රකාශයට පත් කෙරෙන්නේ නැත. එහෙත් දයලෙක්තික අවධියේදී ඒකපාර්ශවීය චින්තනය නිශේධනය වේ.

සමපේක්ෂණ අවධියේදී සිදුවන්නේ නිශේධනාත්මක කාර්යයක් හරහා සිදුවන ධනාත්මක කාර්යයකි. වඩාත් නිවරුදිව කීවොත් නිශේධනය ධනාත්මක ලෙස පිළිගැනීමකි. ප්‍රතිවිරෝධී ප්‍රවර්ගයන් අතර එක්සත් බවක් (unity of categories in their oppositions) පිළිගැනීමකි. දයලෙක්තික අවධියේදී තිබුණු පියමන් කළ නොහැකි සංශයවාදී තැන් මෙහිදී විසඳී යයි. හේගල් එය දක්වා තිබෙන්නේ දයලෙක්තික අවධියේදී තිබුණු සැක සහිත පියමන් කළ නොහැකි ශේෂය පියමන් කිරීමක් ලෙස ය (overcoming the skeptical aporia of the dialectical stage). සමපේක්ෂණ අවදියේදී ඒකපාර්ශවීය ස්වභාවයන්ගෙන් ගැලවී සමස්තය පිළිබඳ අවබෝධයක් ලබා ගනී.

මේ අවධි තුනෙන් කියවෙන්නේ තාර්කික වශයෙන් සද් (real) ඕනෑම චින්තනයකට පැති තුනක් තිබෙන බව ය. මේ අවධි තුන තව දුරටත් මෙසේ සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

1. වියුක්ත අවධිය: යමක් එයටම සමාන බව වියුක්ත ලෙස තේරුම් ගැනීම. එය සංකේතීයව දැක් වූ විට මෙසේය. A=A

2. දයලෙක්තික නිශේධනය: මුලින් ගත් වියුක්ත සඥාභූත තේරුම වැරදි බව තේරුම් ගැනීම. යමක් එයටම සමාන නොවන බව තේරුම් ගැනීම. $A \neq A$

3. සමපෙක්ෂණමය සංයුක්ත අවධිය: යමක් එය මෙන් ම එය නොවේ යැයි තේරුම් ගැනීම. නිශේධනය සමඟ මුසුවීම. A=~A

මෙහිදී යමක අනන්‍යතාව එහි ම නිශේධනය බව තේරුම් ගනු ලැබේ.

හේගල් Logic යන්නෙන් අදහස් කළ දෙය දර්ශනයේ එන පාරභෞතිකවාදය (onto+logics) යන්නට සමාන ය. මේ ක්ෂේත්‍රය තුළදී ඥාණනය හා සත්තාව (knowing and being) යන්න එකිනෙකට තුල්‍ය වන බව කියවේ. මේ නිසාම හේගලියානු පද්ධතිය තුළ ඥාණවිභාගය හා සද්භවවාදය එකිනෙකින් වෙනස් ක්ෂේත්‍රයන් නොවේ. අපගේ චින්තනය අනුගමනය කෙරෙන්නේ සත්ත්තාවේ අභ්‍යන්තර තර්කය බව මෙයින් ප්‍රකාශයට පත්කෙරේ. වෙනත් ලෙසකින් කිවහොත් සත්තාවේ සාරය ක්‍රමාණුකූලව ඥාණනය කර ගත හැකි බව මෙයින් කියවේ. ඩේකාට්ස්ගේ විධික්‍රමයෙන් එක් අදහසකින් තවත් පැහැදිලි අදහසකට යා හැකිය. නමුත් එහිදී එක් අදහසක් තවත් අදහසකට දක්වන සම්බන්ධය පැහැදිලි කෙරෙන්නේ නැත. මෙයින් වෙනස්ව හේගලියානු ක්‍රමයේදී තර්කන ක්‍රියාවලිය ප්‍රවර්ගයන් හරහා නිගාමී ආකාරයට සිදුවේ. දයලෙක්තික ක්‍රියාවලියේදී සිදුවන අදහසේ ස්වයං-වර්ධනයට, පිටතින් බලයක් අවශ්‍ය නොවේ. අභ්‍යන්තර නිශේධනයේ බලය මෙම වර්ධනයට අවශ්‍ය ශක්තිය සපයයි. නිශේධනය යනු වර්ධන ක්‍රියාවලියේදී අඩුවක්, ශේෂයක්, අතිරේකයක් හැමවිටම ඉතිරි වීම ය. මෙම නිශේධනමය කොටස වර්ධන ක්‍රියාවලියට ශක්තිය ලබා දෙයි. දයලෙක්තික චලිතය ක්‍රියාත්මක කරවන්නේත් එක් ප්‍රවර්ගයකින් තවත් ප්‍රවර්ගයක් වෙත තල්ලු කරන්නේත් නිශේධනයේ බලය මඟිනි.

රෝයි බෂ්කර් තමන්ගේ Dialectic: Pulse of Freedom (1993) කෘතියේ දක්වන ආකාරයට දයලෙක්තිකය තුළින් සංකල්පීය (චින්තනමය) හෝ සමාජ ක්‍රියාවලියක වර්ධනය ප්‍රකාශයට පත්කෙරේ. ගැටුම, අන්තර් සබඳතාව, වෙනස් වීම, අළුත් දෙයක් මතු වීම, අන්තර් විනිවිදීම, ප්‍රතිරෝධයන් අතර සබඳතාව, ගැටුම සමනය වීම, යම් තත්ත්වයක් ඉක්මවා යාම ආදිය ප්‍රකාශයට පත් කිරීම සඳහා දයලෙක්තිකය යෙදේ.

හෙගල්ගේ Phenomenology of Spirit කෘතියේ ආරම්භක කොටස තුළත්, Science of Logic කෘතියේ සමස්ත අන්තර්ගතය තුළත් සත්තාවේ තිබෙන විසංවාදී ස්වරූපය විග්‍රහ වේ. මේ ආකාර දයලෙක්තිකයකට සත්භවවාදී දයලෙක්තිකය (ontological dialectics) යැයි කිව හැකිය. එසේ නැත්නම් එයට දයලෙක්තික සතත්භාවවාදයක් (dialectical ontology) යැයි කිව හැකිය. එමෙන් ම සත්තාව පිළිබඳ අපගේ චින්තනය තුළ සිදුවන දැනුමේ වර්ධන ක්‍රියාවලිය තුළ ද දයලෙක්තිකයක් දැකිය හැකිය. එයට ඥානවිභාගාත්මක දයලෙක්තිකය (epistemological diaclectics) යැයි කිව හැකිය. හේගල්ගේ විශ්වවිද්‍යාල දේශන හරහා ප්‍රකාශයට පත් වූ ඓතිහාසික දයලෙක්තිකයක් ද (historical dialectics) ඇත. මෙහිදී මිනිස් ජීවිතයේ ඓතිහාසික ආකෘතීන් විග්‍රහ වේ. අභ්‍යන්තරික විසංවාදය හරහා සිදුවන සමාජ චලනය මෙහිදී විස්තර වේ. උදාහරණ ලෙස හෙගල්ගේ ස්වාමි-සේවක දයලෙක්තිකය (Master-Slave dialectics) ඉදිරිපත් කළ හැක. හේගල් දයලෙක්තිකය තර්කයේ අන්තර්ගතය ලෙස ගත්තත් එය ඕනෑම ප්‍රපංචයකට යෙදිය හැකි සාර්වත්‍රික මූලධර්මයක්, ආකෘතියක් වශයෙන් ගන්නේ නැත. දයලෙන්තිකය නිදහස (freedom) හා සම්බන්ධ වූවකි චින්තනය තුළ හිර වූ අපව ඉන් නිදහස් කර ගැනීම දයලෙක්තිකය මඟින් සිදුකරයි. බෂ්කර් තවදුරටත් දක්වන ආකාරයට හෙගලියානු දයලෙක්තිකය මඟින් මූලධර්ම දෙකක් ප්‍රකාශයට පත්වේ.

I. දයලෙක්තිකය තර්කයේ හේතුවේ තාර්කික පිළිවෙළ ලෙස (dialectic as a logical process of reason)

II. දයලෙකත්කිය එම ක්‍රියාවලියේ ගාමක බලවේගය, ඩයිනමෝව ලෙස (dialectics as the dynamo of this process)

හෙගලියානු දයලෙක්තිකයේ විඥානවාදී මූලධර්මය හෙවත් යථාර්ථය සම්බන්ධයෙන් සමපේක්ෂණමය අවබෝධනය දයලෙක්තිකය සම්බන්ධයෙන් ප්‍රධාන ග්‍රීක මූලාශ්‍රයන් දෙකක එකුවකි. ග්‍රීක ඊලියානු දාර්ශනික අදහස තුළින් කියවුණේ දයලෙකත්කය හේතුමය ක්‍රියාවලිය (reason) බව ය. මෙය නියෝජනය වූයේ සීනෝගේ විරුද්ධාභාස මඟිනි. දෙවැන්න දයලෙක්තික ක්‍රියාවලියක් (process) ලෙස ගත් අයෝනියානු අදහස ය. මේ ද්විත්වය එකතු වීමෙන් ග්‍රීක දයලෙක්තික අදහස නිර්මාණය විය. හෙගලියානු පරමත්වය සබුද්ධික තාර්කික එකක් මෙන්ම ක්‍රියාවලියක් ද නියෝජනය වේ. එය ස්වයං ජනනමය (self generating) එකකි. එය විසින් ම විගලිත වෙමින් එය සොබාදහම (Nature) තුළත්, ආත්මය (Spirit) තුළත් ප්‍රකාශයට පත්වේ. හෙගලියානු දයලෙක්තිකය, සීනෝගේ විරුද්ධාභාස, සොක්‍රටීසියානු සංවාද, ප්ලේටෝනික හා ඇරිස්ටෝටලියානු දයලෙක්තිකයන් හා කාන්ටියානු විචාරයන් හරහා පෝෂණය වී ඇති බව පෙනේ. මෙයට අමතරව ඉහළ පරමත්වයක් වෙත ගමන් කිරීමේ (එනම් දෙවියන් වහන්සේ වෙත ගමන් කිරීම වැනි) ආරෝහණ දයලෙක්තිකය (ascending dialectic) හා පහළ ප්‍රපංචමය දේ තුළින් දයලෙකත්කිය ප්‍රකාශයට පත්වීමේ අවරෝහණ දයලෙක්තිකය (descending dialectic) මේ ක්‍රියාවලිය තුළ ඇත. මේ දයලෙක්තිකයන් දෙක එකතු වීමෙන් හෙගලියානු දයලෙක්තිකය නිර්මිත වී ඇත. ආරෝහණ දයලෙක්තිකය හරහා පරමත්වය සාක්ෂාත් කර ගැනීමත් අවරෝහණ දයලෙක්තිකය මඟින් පරමත්වය ස්වභාවික ලෝකය ලෙස පරාරෝපණය වීමක් නියෝජනය කෙරේ. රෝයි බෂ්කර් දක්වන ආකාරයට දයලෙක්තික තාර්කික ක්‍රියාවලියක් ලෙස ප්‍රතිවිරෝධතා සහවාදයකට ගෙන ඒම, සීමාවන් ඉක්මවා යාම වෙනස්කම්වල එකමුතුව නියෝජනය කිරීම සිදුකරයි.

දයලෙක්තික සබඳතාව හේගල්ගේ මිත්‍ර කවියකු වූ J.C.F. Hölderlin ගේ යෙදුමක් වූ ‍යහචැරසදබ යන්න ඇසුරින් තේරුම් ගත හැකි ය. එයට අනුව දයලෙක්තික සබඳතාව ආදරවන්තයින් අතර ගැටුමක් (like the quarrel of lovers) වැනි ය. එය තමන්ට ඉතාම සමීපතයන් සමඟ ඇති ප්‍රතිවිරෝධී සබඳතාවක් වැනි ය.

ක්‍රියාවලියේ ඩයිනමෝව ලෙස දයලෙක්තිකය විස්තර වන්නේ හෙගල්ගේ Science of Logic කෘතියේ ය. එහි ඩයිනමෝව නම්, නිශේධනමය බලය ය. (grasping of opposites in there unity of of the opposites in the negative). මෙම ඩයිනමෝව ක්‍රියාත්මක වන්නේ එක් එක් අවධියක ඇති අසම්පූර්ණභාවය, අඩුව, අඩු වර්ධනය නිසා ය. මේ අඩුව පුරවා ගැනීම සඳහා ක්‍රියාවලියක නිරත වෙයි (process of becoming). මෙහිදී පරිපූර්ණ භවතාවක් ලබා ගැනීමට උත්සාහ ගනී. මෙම වර්ධන ක්‍රියාවලියට ප්‍රතිවිරෝධයන් අවශ්‍ය ය. හේගල් ට අනුව සත්‍යය සමස්තමය වන අතර සමස්තය ක්‍රියාවලියකි. මේ ක්‍රියාවලිය සබුද්ධිමය එකකි (rational). එහි ප්‍රතිඵලය ජීවිතයට නිදහස උදාකරදීමකි. චින්තනයේ වරද වන්නේ ඒකපාර්ශවීය භාවය ය. මේ ප්‍රතිවිරෝධතාවයන් නැති කර ගැනීම සඳහා වියුක්ත බවෙන් සංයුක්ත බව ලබා ගැනීමට චිනතනය ක්‍රියාත්මක වෙයි. මේ සඳහා දයලෙක්තික උත්කර්ෂණය (dialectical sublation=Aufhebung) සිදුවෙයි.

හෙගල් Aufhebung නම් වචනය යොදා ගන්නේ යම් ප්‍රවර්ග යක් යමක් අත්පත්කරගන්නා ගමන් ම තමන්ව ඉක්මවා යාමේ ක්‍රියාවලිය ගෙනහැර දැක්වීමට ය. මෙහිදී මුලින් පැවති දෙයෙහි යමක් අහෝසි වුවත් මුල් දෙයෙහි යම් සාරයක් සංරක්ෂණය (preservation) වීමක් ද සිදුවෙයි. වෙනත් ලෙසකින් කීවහොත් නිශේධ කිරීම සහ සංරක්ෂණය එකට බැඳී ඇත. හේගල්ගේ Philososphy of Right කෘතියේ නිශේධන සහ සංරක්ෂණ ක්‍රියාවලිය ගොඩනැගෙන ආකාරය පෙන්වා දී ඇත. එයට අනුව පවුල නිශේධනය වීමෙන් සිවිල් සමාජය බිහිවෙයි. සිවිල් සමාජය නිශේධනය වීමෙන් රාජ්‍යය බිහි වෙයි. රාජ්‍යය නිශේධනය වීමෙන් ලෝක ඉතිහාසය බිහි වෙයි. පවුල, සිවිල් සමාජය මඟින් උත්කර්ෂණයට ලක් කෙරෙන අතර එයින් පවුල අහෝසි වීමක් ද සිදුවෙයි. රාජ්‍යය මඟින් සිවිල් සමාජය උත්කර්ෂණයට ලක් කෙරෙන අතර එයින් සිවිල් සමාජය අහෝසි වීමක් ද සිදුවෙයි. පවුලේ සිට සිවිල් සමාජය දක්වා වර්ධනය වීමේදී පවුලේ සාරය සිවිල් සමාජය තුළ සංරක්ෂණය වීමක් ද සිදුවේ.

නිශේධන ක්‍රියාවලිය සහ සංරක්ෂණ ක්‍රියාවලිය Science of Logic කෘතියේදී ද ප්‍රකාශයට පත් වේ. එයට අනුව, ගුණය (Quality)

නිශේධනයෙන් ප්‍රමාණයත් (Quantity), ප්‍රමාණය නිශේධණයෙන් මිනුමත් (Measure), මිනුම නිශේධනයෙන් සාරයත් (Essence), සාරය නිශේධනයෙන් දෘශ්‍යමානයත් (Appearance), දෘශ්‍යමානය නිශේධනයෙන් තථ්‍යතාවත් (Actuality), තථ්‍යතාව නිශේධනයෙන් සංකල්පයත් (Concept), සංකල්පය නිශේධනයෙන් වාස්තවිකත්වයත් (Objectivity), වාස්තවිකත්වය නිශේධනයෙන් පරම අදහසත් (Absolute Idea), පරම අදහස නිශේධනයෙන් සොබාදහමත් (Nature), සොබාදහම නිශේධනයෙන් ආත්මීය මනසත් (Subjective Mind), ආත්මීය මනස නිශේධනයෙන් ආචාරාත්මක වාස්තකවික මනසත් (Ethical Objective Mind), ආචාරාත්මක වාස්තවික මනසත් නිශේධනයෙන් කලාවත් (Art), කලාව නිශේධනයෙන් ආගමත් (Religion), ආගම නිශේධනයෙන් දර්ශනයත් (Philosophy) බිහි වෙයි.

මින් එක් ප්‍රවර්ගයක් තවත් ප්‍රවර්ගයක් මඟින් අහිමි කිරීමෙන් අළුත් දෙයක් අත්පත් කර ගැනීම සහ අළුත් දෙය තුළ පරණ ප්‍රවර්ග යෙහි යම් යම් අංග ලක්‍ෂණ ශේෂ කර ගැනීම සිදුවෙයි. මෙම නිශේධන ක්‍රියාවලියට හේගල් කියන්නෙ නිර්ණයමය නිශේධනය (determinate negation) කියා ය. එහි පරිවර්තනමය නිශේධනයක් ද (transformative negation) ද වෙයි. නිශේධනයෙන් පසු ව සෑම විට ම අළුත් භාවයක් උත්පාදනය (becoming) වනවා යැයි හේගල් පවසයි. මේ නිසා සංකේතීය තර්ක ශාස්ත්‍රයේ නිශේධනයේ නිශේධණය (negation of negation) (~ ~) හා හෙගලියානු නිශේධනය එක හා සමාන නොවේ. සංකේත තර්ක ශාස්ත්‍රයට අනුව යමක් දෙවරක් නිශේධනය කිරීමෙන් මුල් විචල්‍යය ම නැවත ලැබේ. P=~ ~ P

නමුත් හේගලියානු නිශේධනය එසේ නොවේ. P ≠ ~ ~ P / P<~ ~ P

දයලෙක්තික චලනය සිදුවන්නේ අරමුණක් දිශාවට ය. එයට ශක්තියක් දෙන්නේ නිශේධනයේ බලය ය. Science of Logic වල නිශේධනය එක හා සමානව ම ප්‍රතිජානනමය බව (The Negation of it just as much positive ) ලෙස දක්වා තිබෙන්නේ මේ නිසා ය.

නිශේධනයෙන් පසු නිශේධනය කිරීමෙන් ආපසු මුල් ප්‍රවර්ග යම ලැබීම (tautology) හෙගලියානු දයලෙක්තික උත්කර්ෂණයේදී සිදුවන්නේ නැත. මුල් ප්‍රවර්ගයම ලැබීමේ තර්කනයට භවවාදී තර්කනයක් (ontical Logic) යැයි කිව හැකි ය. හෙගලියානු නිශේධන තර්කය හැම විටම අළුත් යමක් ශේෂගත කරන නිසා එයට සද්භවවාදී තර්කයක් (ontological logic) යැයි ද කිව හැකි ය. මේ අනුව කිව හැක්කේ හේගලියානු දයලෙක්තික තර්කය රූපික කිරීම (formalize) කළ නොහැකි බව ය. රූපික තර්කය වලංගු වන්නේ ගණිතය, තර්ක ශාස්ත්‍රය සහ යම් දුරකට ස්වභාවික විද්‍යා ප්‍රපංචයකට ය. මේ ක්ෂේත්‍රයන් තුළ රජයන්නේ ස්වයං-සාම්‍යය ඒකකයන් ය (self-identical units of discourse) ය. එවැනි අන්තර්ගතයන් අවිසංවාදී නියමය (law of non-contradication) සමඟ එකඟ ය. එය දයලෙක්තිකය සමඟ එකඟ නැත. මේ නිසා දයලෙක්තිකය නිගාමී පද්ධතියක් (deductive system) නොවේ. හෙගල් ගණිතයේ විවිධ ශාඛාවන් ගැන දැනගෙන සිටියේය. හෙගල් වීජ ගණිතයේ විශ්ලේෂී ක්‍රමයත් ජ්‍යාමිතියේ සංස්ලේෂී ක්‍රමයත් (analytic and synthetic methods) දැනගෙන සිටියේය. හෙගල්ගේ අදහස වූයේ ඒ විධික්‍රමයන් ඒ ඒ ක්ෂේත්‍ර තුළ දී සාර්ථක බවක් පෙන්නුවත් දාර්ශනික ප්‍රජානනයේදී වලංගු නොවන බව ය. ගණිතය වියුක්ත විද්‍යාවක් වේ. එහිදී දේවල් ඒකක වශයෙන් තේරුම් ගනී. එහි තිබෙන්නේ සංකල්ප අතර වියුක්ත සාමාන්‍යයන්ය. ජීවයක් නැති සබඳතාවයන් ය. හෙගල් ප්‍රකාශ කළේ 7+5=12 යන්න සත්‍ය වන්නේ සංඛ්‍යා පද්ධතියක් තුළ පමණක් බව ය. එය ගණක යන්ත්‍රයකින් පවා ලබා ගත හැකි පිළිතුරකි. දයලෙක්තික උත්කර්ෂණය ගණක යන්ත්‍රයකින් ලබා ගත නොහැකිය. අළුත් දෙයක් උත්පාදනය වීම, අතිරේකයක් ජනනය වීම රසායන විද්‍යාවේ හයිඩ්‍රජන් පරමාණු දෙකකට ඔක්සිජන් පරමාණුවක් එකතු වී ජලය සෑදීම වැනි රසායන විද්‍යා සූත්‍රයක් නොවේ.

හේගල්, ෆිෂ්ටේගේ ආත්මීය විඥානවාදය පිළිගත්තේ නැත. ආත්මය (self-consciousness) කේන්ද්‍රයේ තැබීමේ ෆිෂ්ටේගේ දර්ශනය හේගල් පිළිගත්තේ නැත. ෆිෂ්ටේ, චින්තනයේ හා යථාර්ථයේ ඉහළ ම අවස්ථාව ලෙස අවිසංවාදී නියමය (nothing can be both A and not A) ලෙස පිළිගත්තේය. එය චින්තනයේ ඒකත්වය සමඟ අනුකූල බවත් ඔහු කියා සිටියේය. චින්තනය සත්‍යයක් වන්නේ මෙම

මූලධර්මය අනුගමනය කරන නිසා බවත් ඔහු කියා සිටියේ ය. ෆිෂ්ටේට අනුව යම් පද්ධතියක විසංවාදයක් තිබේ නම් එය සත්‍යය එකක් වන්නේ නැත. නමුත් හෙගල්, ෆිෂ්ටේගේ මෙම හේතු දැක්වීම පිළිගත්තේ නැත. ආත්මීයතාව (subjectivity) යමක් එයට ම සමාන වීම (A=A) නම් මූලධර්මයෙන් හෝ අවිසංවාදී නියමයෙන් තේරුම් ගත නොහැකි බව හේගල්ගේ අදහස විය. ඔහු ඕනෑම අනන්‍යතාවයක පදනම විසංවාදය (contradiction) වන බව ප්‍රකාශ කළේය. සමානතාවයේ සහ වෙනසේ ඒකත්වය (unity of equality and difference) යථාර්ථයේ මූලධර්මය බවත්, ඕනෑම අනන්‍යතාවක පදනම විසංවාදය (contradiction) බව ප්‍රකාශ කළේය. වෙනස තුළ අනන්‍යතාවය පිළිගත්තේ ය (identity of identity and non-identity). ෆිෂ්ටේ තමන්ගේ The Theory of Science කෘතියේ දයලෙන්තිකයේ ත්‍රිත්ව ආකෘතියක් ඉදිරිපත් කළේය. ඒ වාදය, ප්‍රතිවාදය සහ සහවාදය ය (Thesis, Anti-Thesis and Synthesis). මේ ත්‍රිත්ව ආකෘතිය ඔහු නිතර නිතර පාවිච්චි කර ඇත. ෆිෂ්ටේ මේ ආකෘතිය වියුක්ත ආකෘතික (abstract formualism) එකක් ලෙස යොදා ගෙන ඇත. ෆිෂ්ටේ මම (I) සහ මම-නොවන (not I) අතර වෙනසක් ඇති කළ අතර වාදය හා ප්‍රතිවාදය අතර ඇති වෙනස ඊනියා සහවාදය තුළ දිය වී යන බව දැක්වීය. ෆිෂ්ටේට අනුව ආත්මය සරළ සහ මුල සිට අග දක්වා ම ස්වයං-තදාත්මය සණීභූත (fixed) එකකි. ෆිෂ්ටේ ආරම්භ කරන්නේ 'මම', අහංභාවය (I) තුළිනි. එහි දෙවන පියවර මා නොවන්න ය (not I). එනම් මම නොවන සත්තාවය (being). සත්තාව යනු මම නොවන ලෝකය සහ වස්තූන් ය. ෆිෂ්ටේ ට අනුව තමන් සහ තමන් නොවන ලෝකය අතර ප්‍රතිවිරෝධය තුන්වන අවධිය වන සහවාදය තුළ විසඳී යයි. මේ සහවාදය නව ප්‍රවාදයක් වන අතර එයින් නව ප්‍රතිවිරෝධතා ජනනය කෙරේ. කාන්ට්ගේ Critique of Pure Reason කෘතියේ 'The Pure Concept of the Understanding of Catagories' නම් කොටසෙහි අවබෝධයේ පදාර්ථ දොළහක් ගැන සඳහන් කරති. මෙය කාන්ට් සිය Prolegomena to any Futre Metaphysics වල 'Trurscendental Table of the Concepts of the Understanding' ලෙස නම් කර ඇත. මේ පදාර්ථ දොළහ සැදෙන්නේ තුන බැගින් වූ පදාර්ථ හතරක් (3x4) එකතු වීමෙන් ය. මෙහි (Tatality) වනාහි (Unity) සහ (Plurality) සහවාදයක් ලෙසට ගෙන ඇත. සීමාව (Limitation) වනාහි

යථාර්ථය (Reality) සහ නිශේධනය (Negation) අතර සහවාදයක් ලෙසට ගෙන ඇත. හේගල් මෙය පරීක්ෂා කර සිටියේ කාන්ට්ගේ මෙම සොයා ගැනීම ෆිෂ්ටේ දක්වා වෙනත් කිසිවකු වර්ධනය කර නොතිබුණු බව ය. එමෙන් ම ෆිෂ්ටේගේ වියුක්ත දයලෙක්තික සූත්‍රය හේගල් ප්‍රශ්න කළේ ය. හේගල් ෆිෂ්ටේගෙන් වෙනස් ව ආත්මය වනාහි ප්‍රතිපක්ෂවල එකතුවක් (Unity of opposites) ලෙස ගත්තේ ය. ෆිෂ්ටේගේ විධික්‍රමය දයලෙක්තික නොවන (non-dialectical) එකක් යැයි දැක්වීය. කාන්ට්ගේ හෝ ෆිෂ්ටේගේ ප්‍රතිවිරෝධතා එකිනෙක විනිවිදින්නේ නැත. මේ නිසා හේගල් ෆිෂ්ටේ ගේ වාදය, ප්‍රතිවාදය සහ සහවාදය යන ත්‍රිත්ව ආකෘතිය යොදා ගත්තේ නැත. නමුත් අද දක්වා බොහෝමයක් දෙනා හේගලියානු දයලෙක්තිකය ලෙස යොදා ගන්නේ මෙම ත්‍රිත්ව ආකෘතිය ය. දයලෙක්තිකයේ මෙම ඊනියා ආකෘතිය හෙගල් විසින් විවේචනය කරන්නේ පහත ආකාරයට ය.

Of course, the tradic form must not be regarded as scientific when it is reduced to a lifeless schema, a mere shadow, and when scienctific organization is degraded into a table of terms. (Hegel 1977, 29)

දයලෙක්තිකයේ ත්‍රිත්ව ආකෘතිය විද්‍යාත්මක එකක් ලෙසට ගත නොහැකිය. දයලෙක්තිකයේ ත්‍රිත්ව ආකාරයට ජීවයක් නැත. හේගල්ට අනුව දයලෙක්තිකය ත්‍රිත්ව ආකෘතියකින් ප්‍රකාශ කළ නොහැක. මෙහි සහවාදය (Synthesis) යන්න ඉතාමත් නොමඟ යවන සුළු යෙදුමකි. හේගල්ට අනුව කිසිවිටක අවසන් සහවාදයකට පැමිණිය නොහැකිය. ඕනෑම සහවාදයක් තුළ කලින් අවධියේ සංඝටක අන්තර්ගත වන අතර ම කලින් සංඝටක ඉක්මවා යාමේ ගුණාංගද අන්තර්ගත ය. දයලෙක්තිකය ඉදිරියට තල්ලු කරන්නේ ප්‍රතිවිරෝධතා හරහා ය; අතිරේකයන් (Surplus) හරහා ය. මේ අනුව සහවාදයක් ඇති තැනක දයලෙක්තිකය මිය යයි. දයලෙක්තිකයට වාදය, ප්‍රතිවාදය සහ සහවාදය වැනි රූපික සූත්‍රයක් ලබා දීම දයලෙක්තික විරෝධී ය. දයලෙක්තිකය විධික්‍රමයකට (method) හෝ ආකෘතික ව්‍යූහයකට (formal structure) කොටු කිරීම දයලෙක්තික විරෝධී ය. දයලෙක්තිකයේ සැබෑ රූපය නිශේධනය විනා ත්‍රිත්ව රූපික ව්‍යූහයක් නොවේ. දයලෙක්තිකය හැම විට ම ඉඩ දෙන්නේ අසම්පූර්ණත්වයට ය. පරිපූර්ණ ත්‍රිත්ව රූපයකට

ඉඩ නොදෙයි. දයලෙක්තිකය සියළුම රූපකායන් ඉක්මවා යන අතර වෙනත් ආභාසයකින් අතිරේකකරණයක් (suplemenentation) ඉල්ලා සිටියි.

හෙගලියානු පරමත්වය (Absolute) රූපික ආකෘතිගත එකක් නොවේ. පරමත්වය මඟින් ම තමන්ට රූපය ලබා දෙයි. දයලෙක්තික තර්කය ආකෘතියට (Form) හෝ අන්තර්ගතයට (content) සීමා කිරීමට ගන්නා ඕනෑම උත්සාහයක් දයලෙක්තික විරෝධීය. පරමත්වයට රූපයක් නැත. එය ආකෘතික වශයෙන් හිස් ය. එය සද්භවවාදී ය දයලෙක්තිකය සද්භවවාදී තර්කයක් විනා භවවාදී රූපික එකක් නොවේ. හේගලියානු දයලෙක්තිකය දෙන ලද අන්තර්ගතයකට 'පිටතින්'යෙදිය හැකි ක්‍රමයක් නොවේ. හේගල්ට අනුව දයලෙක්තිකය හුදෙක් දර්ශනය තුළ සොයා ගත හැකි මූලධර්මයක් නොවේ. සොබාදහම පරමත්වයේ පරිබාහිර වීමකි; පරාරෝපණයකි. දයලෙක්තිකය සොබාදහම තුළ ප්‍රකාශයට පත්විය හැකි නමුත් එය සොබාදහම තුළ සැඟවී ඇති යථාර්ථයක් නොවේ. හේගල් Phenomenology of Spirit කෘතියේ ස්වභාවදහමේ සංසිද්ධියක් ගැන දයලෙක්තික විස්තරයක් කරයි.

The bud disappears in the bursting forth of the blossom, and one might say that the former is refuted by the latter: simillary, when the fruit appears, the blossom is shown up in its turn as a false manifestation of the plant, and the fruit now emerges as the truth of is instead. (Hegel 1977, 02)

මෙයින් කියවෙන්නේ සොබාදහම චින්තනයෙන් පරිබාහිර එකක් නොවන බව ය; චින්තනය හා බැඳුණු සමස්තයක් බව ය. දයලෙක්තිකය සොබාදහමේ මල් පොහොට්ටු, ගෙඩි තුළ සැඟවී තිබෙන මූලධර්මයක් ද නොවේ. හේගල් මෙහිදී විද්‍යාවෙන් පහදා දිය හැකි මල්, පොහොට්ටු ඇතුළත ඇති රසායනික විද්‍යාත්මක යථාර්ථයක් ගැන නොකියයි. භවවාදී යථාර්ථය (ontical reality) ගැන කතා නොකරයි. ඒ වෙනුවට හේගල් කතා කරන්නේ සත්භවවාදී යථාර්ථයක් (ontological reality) ගැන ය. පොහොට්ටුව මල බවට පත් වන විට මල තුළ පොහොට්ටුවේ යමක් ශේෂ ගත කෙරෙන අතර පොහෝට්ටුව ඉක්මවා යාමක් ද සිදුවේ. පිරිමි ගැහැණු පරාග

එක්වී නව සංවාදයක් ලෙස ඵලයක් ජනිත වනවා ය යන ව්‍යාජ දයලෙක්තික සූත්‍රයක් හෙගල් මතු කරන්නේ නැත. මේ අනුව ඉස්ගෙඩියා ගෙම්බා බවට පත්වීම හෝ ඕක් ගෙඩිය ඕක් ගසක් බවට පත්වීමට ඇත්තේ සත්භවවාදී දයලෙක්තික පදනමක් විනා රසායන විද්‍යාත්මක පදනමක් නොවේ. දයලෙක්තිකය සංකල්පීය (Logical) ලෙස, සමාජීය (Spiritual) ලෙස ස්වභාවික (Natural) ලෙස ප්‍රකාශයට පත්විය හැකි වුවත් ඒ සියල්ල පරමාත්මයේ විගලිත රූපයන් ලෙස මෙහිදී සැලකිය යුතු ය. මේ අනුව දයලෙක්තිකය අයත් වන්නේ ඕනෑම දෙයක් සමඟ බැඳී ඇති පාරභෞතික, සත්භවවාදී ක්ෂේත්‍රයට ය.

## 5. සාරය පිළිබඳ දහම ඇසුරෙන් දයලෙක්තිකය

හෙගල්ගේ Science of Logic කෘතියේ එන සාරය පිළිබඳ දහම (The Doctrine of Essence) හෙගලියානු දයලෙක්තිකය අවබෝධ කර ගැනීමට ඇති ප්‍රධාන මූලාශ්‍ර ය. Science of Logic කෘතිය මඟින් සමස්තයක් වශයෙන් ආවරණය කරන්නේ සත්තාව (Being), සාරය (Essence). සංකල්පය (Concept) යන දයලෙක්තික සබඳතාවය ය. සත්තාව යනු දේවල් හි දෙන ලද තත්ත්වය (givennes of things). මෙම දෙන ලද තත්ත්වය හිස් එකකි. සත්තාව තුළින් අපට ලබාදෙන්නේ අව්‍යවහිත (immediate) සත්‍යයන් ය. එයින් ගැඹුරු සත්‍යයක් හෙළිදරව් කරන්නේ නැත. සමස්තය පිළිබඳ අවබෝධයක් ලබා දෙන්නේ නැත. සත්තාවේ සිට සාරයට පැමිණීම යනු සත්තාවෙන් විචාරාත්මක තැනකට පැමිණීම ය. සත්තාවේ සිට සාරයට පැමිණීම යනු සත්‍යයේ වඩාත් ගැඹුරු තලයකට කාන්දු වීමකි. සත්තාවේ සිට සාරයට පැමිණීම යනු පොදුජන විඥානයෙන් ඔබ්බට ඇති අනුභූති උත්තර දැනුමක් වෙත ප්‍රවේශ වීමය. හේගල් පවසන 'the truth of being' යනු මෙම සාරය ය. ඒ වනාහි පොදු ජන විඥාණයට පිටුපසින් ඇති අභ්‍යන්තර සත්‍යයක් අවබෝධ කර ගැනීම ය. සාරයේ ප්‍රවර්ගයක් ලෙස හේගල් 'Reflection' යන්න දක්වයි. එයට දිය හැකි සිංහල පරිවර්තනය 'ප්‍රත්‍යවෙක්ෂණය' යන්න ය. අපි යම් මතුපිටක් දුටු විට මතුපිට ඒ ආකාරයෙන් දිස් වන්නේ ඇයි ද යන්න සෙවීමට පෙළඹෙමු. මෙය හරහාය දෘශ්‍යමානය හා සාරය (යථාර්ථය) යන බෙදීම මතු වන්නේ ය. මේ පිළිබිඹුවෙන් ඔබබට

යාම සඳහා හේගල් සමපෙක්ෂණය (Speculation) යෝජනා කරයි. 'Specualtion' යන්නෙහි ජර්මන් වචනය Spekulation ය. ලතින් වචනය වන්නේ speculum ය. එහි තේරුම 'පිළිබිඹු කිරීම' (mirror) යන්න ය. මුලින් ම මෙම යෙදුම භාවිත වූයේ දෙවියන් වහන්සේ ව පිළිබිඹු කිරීම යන අර්ථයෙනි. වෙනත් ලෙසකින් ප්‍රකාශ කළහොත් දේවල්වල දෘශ්‍යමානයෙන් ඔබ්බට ගොස් අව්‍යාජත්වයට ළඟාවීමේ අර්ථයෙනි. හේගල් සහ ශෙලිං යන දෙදෙනා ම සමපේක්ෂණය ප්‍රතිජානනමය ලෙස භාර ගත්තේ කාන්ට්ගේ දෘශ්‍යමානය (ප්‍රපංචය) ඉක්මවා ගොසින් නිෂ්ප්‍රපංචය දැන ගැනීමේ ක්‍රමවේදයක් වශයෙනි. චින්තනය තුළ මතුවිය හැකි දෙබෙදුම් ඉක්මවා යාම සඳහා සමපේක්ෂණය යෙදා ගැනීමට සිදුවේ. සමස්තයෙන් කොටසක් පමණක් අවබෝධ වන ඒකපාර්ශවීය චින්තනයෙන් ගැලවීම සඳහා මෙය යෝජනා කරයි. සමපේක්ෂණය ඇතුළත් දයලෙක්තික චින්තනයේදී දේවල් වල අධ්‍යහාරව ඇති විසංවාදය තේරුම් ගනී.

හේගල් දෘශ්‍යමානය වනාහි සැඟවුණු සාරයක වසඟකාරී පිටපොත්ත ලෙස නොගනියි. මෙහිදී දෘශ්‍යමානය සමස්තයේ එනම් පරමත්වයේ ස්වයං-ප්‍රදර්ශනයක් ලෙස ගනියි. මතුපිට පෙනුම සමස්තයේ ම කොටසක් ලෙස තේරුම් ගත යුතු බව මෙහිදී කියැවේ. සමස්තය සහ කොටස අභ්‍යන්තරික වශයෙන් සම්බන්ධ වී තිබෙන ආකාරය හේගල් පහදයි. සමස්තය (whole) යන්නට හේගල් ලබා දෙන නාමය සාරාත්මක (essential) යන්න ය. කොටසක් කොටසක් වන්නේ මේ සමස්තය අනුව ය. කොටස් දශ්‍යමාන (appearance) වන්නේ සමස්තය හරහා ය. කොටස් එක්සත් කරන මූලධර්මය (unityin principle) සමස්තය වෙයි. උදාහරණ ලෙස අතපය, ඇඟිළි යන දෘශ්‍යමාන කොටස් ඒකාබද්ධ කරන්නේ ශරීරය නම් සමස්තය මඟින් ය. ශරීරය යන්න සද්භවවාදී වූවකි. සාරය අව්‍යවහිත ලෙස අපට නොපෙනේ. එය අව්‍යවහිත ලෙස පෙනෙන දෙයට යටින් ඇති සමස්තයකි. ඒ ක්ෂේත්‍රයට යෙදෙන්නේ 'mediacy' යන වචනය ය. මේ ක්ෂේත්‍රය අවබෝධ කර ගැනීමට වෙනත් දෙයක් මාධ්‍යය කර ගත යුතු නිසා එම වචනය යොදා තිබේ. චාල්ස් ටේලර් තමන්ගේ Hegel (1975) කෘතියේ මෙසේ දක්වයි.

We come to Essence by rellecting on Being. (Taylor 1975, 258)

සත්තාව මාධ්‍යය කර ගෙන සත්‍යයට ප්‍රවේශ විය යුතුය. මෙහිදී සිදුවන්නේ සත්තාව මඟින් ආරම්භ කර එහි අඩුව දැක එය යටින් ඇති සාරය දිශාවට ගමන් කිරීම ය. පරිබාහිර වශයෙන් පිළිබිඹු වන දෙය (reflection) යම් අභ්‍යන්තර සත්‍යයක පිළිබිඹුවකි. චාල්ස් ටේලර් තව දුරටත් මෙසේ කියයි.

We must also understand this external observable reality as emanating from essence. (Taylor 1975, 258)

එළියෙන් දිස්වෙන නිරීක්ෂණයක් අභ්‍යන්තර සාරයකින් නිකුත් කරනු ලබයි. ටේලර් තවදුරටත් මෙසේ දක්වයි.

Underlying necessity posits (setzt) this observed as something external…external reality as posited by the substrate. (Taylor 1975, 259)

මේවායින් කියවෙන්නේ කුමක්ද? බාහිර පරිවර්තනය අනුගමනය කරන්නේ ඇතුළත අභන්තර චලනය වේ. එළියෙන් ප්‍රකාශනයක් ලෙස දිග හැරෙන්නේ (self-unfoolding) අභ්‍යන්තර සාරයක් බව ය. එළියේ ප්‍රකාශනය අනුගමනය කරන්නේ ඇතුළත අවශ්‍යතාවයකි. මෙහි දී අවධාරණය කරන කාරණයක් නම් එළියෙන් පෙනෙන යථාර්ථය අභ්‍යන්තතර සාරය දැකීමට බාධාවක් නොවන බව ය. එමෙන් ම එළියේ දෘශ්‍යමානය, සාරය වසාගෙන සිටින යකඩ තිරයක් ද නොවේ. එය අභ්‍යන්තර යථාර්ථයෙන් අවශ්‍යයක ලෙස එළියට දමන දෙයකි. විගලිත කෙරෙන දෙයකි. මතුපිට පෙනුම අභ්‍යන්කර සාරයේ ම කොටසකි. බාහිර යථාර්ථයට හේගල් යොදා ගත් වචනය වූයේ 'Shein' යන්න ය. එය ඉංග්‍රීසි භාෂාවට shine ලෙස පරිවර්තනය වේ. එහි සිංහල තේරුම 'දිළිසෙනවා' යන්න ය.

දැනුම අව්‍යවහිත මතුපිටකින් නතර නොකිරීම හේගලියානු දයලෙක්තිකයේ ප්‍රධාන භූමිකාවකි. 'අව්‍යවහිත බවෙන් ඔබ්බෙහි යමක් ඇතැයි උපකල්පනය කරමින් ඒ දෙසට ගමන් කිරීම හෙගල් mediated knowledge ලෙස හැඳින්විය. දයලෙක්තිකය ක්‍රියාත්මක වන්නේ වෙනත් දෙයක ආධාරයෙන් කෙලින් ම යා නොහැකි ක්ෂේත්‍රයකට පියමන් කිරීමේදී ය. මෙයින් කියැවෙන්නේ අපට යමක්

අව්‍යවහිත ලෙස මෙන් ම වෙනත් දෙයක් මාධ්‍යය කරගෙන දැනගත හැකි බව ය. මම දෙවැනි අර්ථයට 'reflect' යන්න යෙදේ. මෙම විනිවිදීමෙන් කර උපග්‍රහණය කිරීමට ව්‍යුත්පන්න කිරීමට 'postulate', 'posited', 'inferred' යන වචන හේගල් positing reflection, external reflection, determining reflection වශයෙන් දැක්වෙන ත්‍රිත්වයෙන් සමස්ත සාරයේ තර්කය අනාවරණය කෙරේ.

**6. අනන්‍යතාවය, වෙනස සහ ප්‍රතිවිරෝධය**

හෙගල් සාර්වත්‍රික චින්තන නියම සෑම චිනත්නයක ම පදනම වශයෙන් ගනී. ඒවාට හිමි පරම ස්වභාවයක් ඇත. ඒවා අමතර වශයෙන් සාධනය කිරීමේ උවමනාවක් නැත. අනන්‍යතාවය පිළිබඳ සංකල්පය මුල් වතාවට දාර්ශනික ආකාරයකට ඉදිරිපත් කළ ඇරිස්ටෝටල්ගේ චින්තන නියම තුළ සාකච්ඡා වී ඇත. යම් වෙනස්වීම් සන්තතියක් තුළ යමක් දිගට ම ශේෂ වනවා නම් එතන අනන්‍යතාවයක් ඇතැයි අපි සිතමු. (continuity of something). හේගල්ට අනුව ගණිතය අනන්‍යතා නියමය ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයකි. තර්ක ශාස්ත්‍රය නොමැතිව ගණිතය අර්ථශූන්‍යය ය. ගණිතය තුළ A=A යන්න හුදු පුනරුක්තිමය (tautological) ප්‍රකාශනයක් පමණි.

හෙගලියානු දර්ශනයේ එන ප්‍රධාන නැවුම් ඉදිරිපත් කිරීමක් වූයේ යමක අනන්‍යතාව අනෙක් දේවල් වලට ඇති සබඳතා හා වෙනස්කම් හරහා බිහිවන බව ය. අපගේ සාමාන්‍යය චින්තනයේ දී අනන්‍යතාවය සහ වෙනස එකිනෙකකින් පරස්පර ය. නමුත් හෙගලියානු සමපේක්ෂණ දැක්ම තුළ අනන්‍යතාව සහ වෙනස්කම් එකට පවතී. මේ අනුව හේගල් කියන්නේ යම් අනන්‍යතාවයක් ලබා ගැනීම (to be something or to possess identity) යනු අනෙක් දේවල් වලින් වෙනස්වීම ය. මෙයින් කියවෙන්නේ යම් වස්තුවක අනන්‍යතාව යනු එයට ආවේණික වශයෙන් ඇති දෙයක් නොවන අතර අන් දෙවල් වලට ඇති සබඳතාව අනුව අනන්‍යතාවය බිහිවන බව ය. පිරිමිභාවයේ අනන්‍යතාවය යනු එය ස්ත්‍රීභාවය දක්වන සබඳතාවය ය. එසේ නැතිනම් ස්ත්‍රීභාවය නොවීමේ සබඳතාවය පිරිමිභාවය වේ. කොළපාට වීම යනු වර්ණාවලියේ අනික් වර්ග නොවීමය. අඩි 5ක් පළල වීම යනු අඩි 5 කට වැඩි හෝ අඩු නොවීමය.

හේගල් අවධාරණය කරන්නේ අනන්‍යතාවය යනු සබඳතාවයක් බව ය. X හා Y වලට සම්බන්ධ වන්නේ Y යන්න X වලින් වෙනස් වන්නේ නම් ය. යමෙක් සමඟ අනන්‍යය වීමේ ක්‍රියාවලියක් යනු අනික් ඒවායින් වෙනස් වීමේ ක්‍රියාවලියක් ය. මේ අනුව අපට කතා කළ හැක්කේ වෙනස්කම් තුළ ඇති අනන්‍යතාවයන් ය (identity in difference). මනුෂ්‍යයා නම් අනන්‍යතාවය විවිධ ශාරීරික කොටස් හා ඒවායේ විවිධ ක්‍රියාකාරීත්වයන්ගේ එකතුවෙන් බිහි වී ඇත. අතපය, ඇඟිලි, හිස, බඩ ආදී කොටස්වල විජීය එකතුවෙන් මනුෂ්‍යයා ගොඩනැගෙන්නේ නැත. මනුෂ්‍යයා යනු ඒවා අතර සබඳතාවය ය. අනන්‍යතාවයට අදාළ මූලධර්මය හේගල් කතා කරන්නේ Sicence of Logic කෘතියේ 'Essence' කොටසෙහි ය. මෙහිදී හේගල් චින්තන නියමය හෝ තර්කශාස්ත්‍රයේ නියමයක් වන අනන්‍යතා නියමය විචාරයට ලක් කරයි. ඇරිස්ටෝටල් ද්විකෝටික තර්කය වශයෙන් හඳුනාගන්නා ක්ෂේත්‍රය තුළ අනන්‍යතා නියමය අන්තර්ගත ය. අනන්‍යතා නියමයෙන් සරල ව කියැවුණේ A=A හෝ A=~ ~ A ය. හේගල් මේ අනන්‍යතා නියමය බැහැර නොකරයි. එපමණක් නොව අවිසංවාදී නියමයද (low of non-contradiction) බැහැර නොකරයි. අවිසංවාදී නියමයෙන් කියැවුණේ A සහ ~A එක විට සත්‍යය විය නොහැකි බව ය. හේගල් මධ්‍ය බහිෂ්කාර නියමය ගැන ද කතා කරයි (something is either A or not A, there is no third) (Hegel 1969, 438). යමක් සහ එය නොවන්නා අතර මැදක් නැති බව මෙයින් කියැවේ. හේගල්ගේ විවේචනය වන්නේ මේ චින්තන නියම අඩුපාඩු (defective) සහිත එවා වන බව ය. නොගැඹුරු අවබෝධයක නිර්මිතයක් බව ය. මේ අනුව A=A යන්න අර්ධ සත්‍යයක් පමණි. හේගල් මෙහිදී මතු කරන්නේ ඕනෑම අනන්‍යතාවයක් යනු අනෙකාට (other) දක්වන සබඳතාවය හරහා නිර්මාණය වන බව ය.

හෙගල් අවිසංවාදී නියමය ප්‍රශ්න කරමින් ගෙන හැර දක්වන්නේ විසංවාදී මූලධර්මය (low of contradiction) ය. සාම්ප්‍රදායික මූලධර්මය අනුව X යන්නට Y නම් චරිත ලක්ෂණය සහ Y චරිත ලක්ෂණයේ නිශේධනය එක විට සිදුවිය නොහැක. ඇපල් ගෙඩියකට එක විට කොළ පාට සහ කොළ පාට නොවන්න එකවිට නොහැකිය. එක් මොහොතක කොළ පාට නම් අනෙක් මොහොතේ රතු පාට විය යුතු ය. එමෙන් ම "සමචතුරස්‍ර වෘත්තයක්" යන්න විකාරයක්

විය යුතුය. එහෙත් හේගල්ගේ ප්‍රවේශයට අනුව ප්‍රතිවිරෝධතා වලට එකට පැවතිය හැකි ය.

Everything is inherently contradictory…there is nothing is contradictory … (Hegel 1969, 439)

විසංවාදය ඕනෑම දෙයකට ආවේණික ලක්ෂණයක් බවත් විසංවාදී නොවන කිසිවක් නොමැති බවත් මෙයින් කියැවේ.

විසංවාදය හේගලියානු දයලෙක්තිකයේ මූලධර්මය ය; චින්තනයේත් යථාර්ථයේත් මූලධර්මය ය. මෙමගින් සනීභූත අනන්‍යතාවයන් දියකර හරී. මෙහි විසංවාදය යනු නිශේධනය ය. එය යථාර්ථයේ වාහකයා ය. සත්තාවේ (Being) නිශේධනය (Nothing) අසත්තාව (Non-Being) ලෙස හේගල් ගනී. මෙම විසංවාදී මූලධර්මය ඔස්සේ චින්තකයක් හෝ අදහසක් වර්ධනය වෙයි. ඕනෑම අවධියක් ගැටුම (conflict) ප්‍රතිවිරෝධය (opposition) සහ නිශේධනය හරහා වෙනත් අවධියක් වෙත ගමන් කරයි. ඕනෑම සංකල්පයක් ඊට ආවේණික ලෙස විසංවාදී වේ. ඕනෑම අදහසක් එහි අර්ථය ලබා ගන්නේ එහි ප්‍රතිවිරුද්ධ අදහස් වලින් ය. නිශේධනය සහ ප්‍රතිවිරෝදය ඕනෑම දෙයක වර්ධනයෙහි මූලධර්මය වේ. වෙනස තුළ අනන්‍යතාවය Science of Logic වල මෙසේ දක්වා ඇත. මෙම ස්ථානය හෙගලියානු දයලෙක්තකිය තේරුම් ගැනීමට ඇති හොඳම ස්ථානයක් ලෙස ගත හැකිය. එය උපුටා දක්වමු.

Father is the other of son, and son the other of father, and each only is as this other of the other; and at the same time, the one determination only is, in relation to the other; their being is a single subsistence. The father also has an existence of his own apart from the son-relationship; but then he is not father but simply man; just as above and beow, right and left, are each also a reflection-into-self and re something apart from their relationship, but then only places in general, Opposites, therefore, contain contradiction in so far they are, in the same respect negatively related to one another to one another or sublate each other and are indifferent to one another. (Hegel 1969, 441)

මෙම දයලෙක්තික විග්‍රහයෙන් හේගල් ප්‍රකාශ කරන්නේ විසංවාදය ප්‍රතිවිරෝධය ක්‍රියාත්මක වන්නේ පියා සහ පුතා අතර නොවන බව ය. මම වනාහි මගේ පුතාට පියෙකි. එමෙන් ම මම වනාහි මගේ මගේ පියාට පුතා ය. හෙගල් කතා කරන්නේ මා තුළ එක විට පියා සහ පුතා අන්තර්ගත වීමේ විසංවාදී පැවැත්ම ගැන ය. අවිසංවාදී නියමයට අනුව නම් මට එක විට පියා සහ පුතා විය නොහැක. නමුත් හේගල්ට අනුව විය හැකි ය. හේගල් මෙහිදී කතා කරන්නේ මම අනෙකාට දක්වන සබඳතාවය ගැන ය. අනෙකාට අනුව මම කවුද? පියා ද? පුතා ද? මාගේ අනන්‍යතාවය හිස් ය. එම හිස් බව පියාගෙන් මෙන් ම පුතාගෙන් ද පිරවිය හැකි ය

**ආශ්‍රිත ග්‍රන්ථ:**


1. Bhaskar (1993) Dialectics: The Pulse of Freedom, London: Verso.
2. Hegel, G.W.F. (1969) Science of Logic, Tr. by A.V. Miller, London: George Allen and Unwin.
3. Hegel, G.W.F. (1975) Hegel's Logic: Part One of the Enccyclopedia of Philosophical Sciences, in Basic Outline: Part I: Sicence of Logic,eds. K. Brinkmann and D.O. Dahlstrom, Cammbridge: Cambridge Univerity Press.
4. Hegel, G.W.F. (1977) Phenomenology of Spirit, Tr. by A.V. Miller, Oxford: Oxford University Press.
5. Taylor, C (1975) Hegel, Cambridge: Cambridge Uiversity Press